දුරකථන / தொலைபேசி இல. / Telephone Nos.:

අමාත්‍යතුමා / அமைச்சர் / Minister — 2784832, Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary — 2784812

කාර්යාලය / அலுவலகம் / Office — 2785141– 50, Fax: 2784846

ඊමේල් / ஈ-மெயில் / E - mail: isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. ........................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாய"
பத்தரமுல்லை.
"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. — ඊඩී/1/21/1/2/23

දිනය / திகதி / Date — 2009/06/02

චක්‍රලේඛ අංක - 2009/17

සියලුම පළාත් ලේකම්වරුන් ,

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් ,

ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ,

විභාග කොමසාරිස් ජනරාල් ,

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් ,

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් ,

සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් ,

සියලුම අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන් ,

සියලුම ගුරු විද්‍යාල විදුහල්පතිවරුන් ,

සියලුම පිරිවෙන් පරිවෙණාධිපති හිමිවරුන් ,

සියලුම විදුහල්පතිවරුන් වෙත

<u>ඩෙංගු මර්දන වැඩසටහන</u>

මෙයට පෙර මෙම වැඩසටහන සම්බන්ධයෙන් නිකුත්කර ඇති චක්‍රලේඛ 2001/17 අහිබවා මෙම චක්‍රලේඛය මෙයින් ඉදිරියට වලංගු වේ.

වර්ෂා කාලය ආරම්භ වීමත් සමඟ ම ඩෙංගු රෝගයට ගොදුරු වීම වැඩි වන අතර මෙම වර්ෂයේදී ඩෙංගු පැතිරීම විශාල වශයෙන් වර්ධනය වී ඇත.ඩෙංගු මදුරුවා දහවල් කාලයේ ගැවසෙයි.බැවින් තම පාසල , අධ්‍යාපනික ආයතනය අවට පරිසරය ඩෙංගු රෝගයට ගොදුරු වීමට සෘජු බලපෑමක් ඇති කරයි.

ඩෙංගු මර්දනය සඳහා ගත යුතු සාර්ථක ම හා ප්‍රභලතම ක්‍රියාමාර්ගය වනුයේ ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන නැති කර දැමීම හා අවට පරිසරය පිරිසිදුව පවත්වා ගෙන යාමය.

මේ සඳහා 2009 ජුනි 08 - 15 සතිය "ඩෙංගු සතිය" ලෙස නම් කරන අතර එම කාල සීමාව තුළ පහත සඳහන් ක්‍රියාමාර්ග වල යෙදීම සිදු විය යුතුය.

01. ගුරු විද්‍යාල / අධ්‍යාපන විද්‍යාපීඨ/පිරිවෙන් / අධ්‍යාපන කාර්යාල / පාසල් තුළ හා අවට පරිසරය පිරිසිදු කිරීම , කසළ කළමනාකරණය කිරීමට කටයුතු කිරීම.

02. මදුරුවන් බෝවන ස්ථාන නොමැති බවට තහවුරු කර ගැනීම.

03. ඩෙංගු රෝගය ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන පිළිබඳ ව පාසල් සිසුන් / ගුරු සිසුන් / ආයතනයේ සේවකයින් දැනුවත් කිරීම.මේ සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් , පළාත් පාලන ආයතන වල නිලධාරීන් හෝ අදාල වෙනත් නිලධාරීන්ගේ සහය ලබා ගැනීම.

04. සිසුන් මඟින් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් සැලසුම් කිරීම.

ඩෙංගු රෝග මර්දන කටයුතු සාර්ථක වීමට නම් මෙම සතියට එක් වරක් පමණක් වැඩසටහන් සීමා නො විය යුතු අතර ක්‍රමවත් ව වැඩසටහන සැලසුම් කර ක්‍රියාත්මක කිරීමත් අඛණ්ඩ ව පවත්වා ගෙන යාමත් සිදු විය යුතුය.

මේ සඳහා පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

01. සෑම සතියක ම ආරම්භක දින (සඳුදා )විනාඩි 30 ක වේලාවක් පාසල/අධ්‍යාපන විද්‍යා පීඨය/ගුරු විද්‍යාලය / පිරිවෙන/ අධ්‍යාපන ආයතනය ඇතුළත හා අවට පිරිසිදු කිරීම සහ මදුරුවන් බෝවන ස්ථාන නොමැති බවට තහවුරු කර ගැනීම.

මේ සඳහා පාසල්වල දී ශිෂ්‍ය සමාජ , ශිෂ්‍ය හට කණ්ඩායම් , බාලදක්ෂ , පරිසර නියමු කණ්ඩායම්වල සහභාගිත්වය ලබා ගත යුතු අතර අනෙකුත් ආයතනවල ද විශේෂ කණ්ඩායමකට වගකීම පැවරිය යුතුය.මෙම කාර්යයේ වගකීම එක් ගුරුවරයෙකුට/කථිකාචාර්ය වරයෙකුට/ නිලධාරියෙකුට පැවරිය යුතුය.

02. ක්‍රියාත්මක වැඩසැලසුම් පිලිබඳ ව අඛණ්ඩ ව නියාමනය , අධීක්ෂණය හා ඇගයීම සිදු විය යුතු අතර ආයතන ප්‍රධානියා විසින් මේ පිලිබඳ විශේෂ අවධානයක් යොමු කිරීම.

03. පාසල් /අධ්‍යාපන විද්‍යා පීඨ /ගුරු විද්‍යාල / පිරිවෙන් අධීක්ෂණ කටයුතුවල දී ඩෙංගු මර්දන වැඩසටහන ක්‍රියාත්මක වන බවට තහවුරු කිරීම.

04. ඝසල කලමනාකරණය සඳහා නිසි ක්‍රමවේද අනුගමනය කිරීම, ඝන අපද්‍රව්‍ය මදුරුවන් බෝ නො වන පරිදි විනාශකොට බැහැර ලීම සහ පලාත් පාලන ආයතන හා සම්බන්ධ වෙමින් අපද්‍රව්‍ය ඉවත ලීමේ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම

05. පාසල් ප්‍රජාව හෝ අවට ප්‍රජාව වැඩසටහනට දායක කර ගැනීමට කටයුතු කිරීම.

ඩෙංගු උවදුර මර්දනය සඳහා සෑම පුද්ගලයෙකුගේ ම දායකත්වය අත්‍යවශ්‍ය වන බැවින් මෙම කාර්යය සඳහා විශේෂ අවධානය යොමු කොට ක්‍රියා කිරීමට හා අදාල පාර්ශවයන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස අවධාරණය කරමි.

එම්.එම්.එන්.ඩී. බණ්ඩාර

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත - ලේකම් - සෞඛ්‍ය අමාත්‍යාංශය

ලේකම් - පලාත් පාලන අමාත්‍යාංශය

අතිරේක ලේකම්වරුන් - අධ්‍යාපන අමාත්‍යාංශය

විද්‍යාපීඨ කොමසාරිස් - අධ්‍යාපන අමාත්‍යාංශය